**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**විෂය - නර්තනය** | **ශ්‍රේණිය - 9** | **දෙවන වාරය සතිය - 01**

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය, කලවාන.

නිපුණතා මට්ටම : නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම : **<u>පන් නෙලීමේ හා සොකරි කවි ගායනා කරමු.</u>**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 9 ශ්‍රේණියෙ දී පළමු හා දෙවන වාරයේ දී ගායනා කරනලද ගායනා නැවත වරක් ගායනා කරන්න.

දෙවන පියවර : එම ගායනා සේම පන් නෙලීමේ හා සොකරි කවිත් අපි ගායනා කල යුතුයි, ඊට පෙර මේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකිදැයි බලන්න.

1 - පන් නෙලීමේ හා සොකරි කවි ගායනා සිදුකරන්නේ කුමන කාර්යයේදිද ?
2 - පන් නෙලීමේ හා සොකරි කවි ගායනා කරන්නේ කුමන හේතුවක් නිසා ද?
3 - පන් නෙලීමේ හා සොකරි කවි වලින් පිළිබිඹුවන්නේ කුමන කරුණු පිළිබඳවද ?
4 - පන් නෙලීමේ හා සොකරි කවි නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද ?
5 - පන් නෙලීමේ හා සොකරි කවි තුළ දක්නට ඇති අන්තර්ගතයන් මොනවාද ?

තුන්වන පියවර : දැන් පහත කවි ඔබ ගායනා කිරිමට හැකිදැයි, උත්සාය කරන්න.

හතරවන පියවර : ගායනා කිරීමට නොහැකිනම් සිත් තැවුල් ඇතිකර නොගන්න ඔබට පාසැල් ගිය පසු ඉගෙන ගැනීමට හැකිය, ඒ නිසා මෙම කවි පාඩම් කරගන්න.

පන් කවි - පන් කර්මාන්තයට අදාළ ව පන් නෙළීමේ කවි නිර්මාණය වී ඇත. ගැමි ජනයා තුළ පවතින සාමූහිකත්වය, එකමුතුබව හා සුහදතාව මෙම කවි ගායනා මඟින් විද්‍යමාන වේ. ඇතැම් ශාන්තිකර්මවල පන්නෙළීමේ කවි ගායනා අන්තර්ගත වී ඇති අතර ඒවා සරල තාලයකින් ද නාදමාලාවලින් ද යුක්ත වේ.

මාත්‍රා 3 තාලය ,

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනිවන් පන් තිබෙන කොට
නෑනෙ නුඹත් එනව ද පන් නෙළන්නට

කොනින් කොනට පන් උදුරා ගන්නේ
තැනින් තැනට පන් අහුරු දමන්නේ
අනුන්ගෙ පන් කොළ එක් නොකරන්නේ
බෑණුන් අහන්නට වෙයි දූනගන්නේ

මාත්‍රා 3 තනිතත හෝ මාත්‍රා 2+4 දෙතිත,

ඉරසඳ පාන විල කොතැන ද තුන්හිරියා
ඉරසඳ පාන විල මෙතැනයි තුන්හිරියා
පන් කම් කරන අඟනෝ කාටත් සරියා
මට පැදුරකට පන් දෙනව ද තුන්හිරියා

සොකරි කවි - උඩරට වන්නි ගැමි සමාජයෙහි ප්‍රචලිත සොකරි නාටකයේ දී මෙම කවි ගායනය කරනු ලබයි. සොකරි නාටකයේ අන්තර්ගත චරිත මූලකි කොට ගෙන එහි කතා ප්‍රවෘත්තිය විකාශනය වන්නේ කවි ගායනා මගිනි. එබැවින් සොකරි නාටකයෙහි ආරම්භයේ සිට අවසානය දක්වාම කවි ගායනා කරනු ලැබේ. ඒවා සරල ඒකාකාරී නදරටාවකින් යුක්තවේ. සියලුම කවි ගායනා කරනු ලබන්නේ මාත්‍රා 3 තනි තිතට අයත් "දෙං ජිජිගත" බෙර පදයේ තාලයට අනුවය.

වෙදා නටන්නේ පළමු ව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි තියන්නේ

සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග තියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොලවන්නී
කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නී

ලාභක් විතර වී අවිවේ වනාලා - දොළසක් විතර පෙති ගෝමර ඉසීලා
අතක් දිගට නිල් වරලස මුදාලා - සොකරි සිටී වී අවිවේ වනාලා

සැකසීම - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලීය
සෞන්දර්ය අංශය වෙනුවෙන්,
එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා,
රඹුක මහා විද්‍යාලය,
පොතුපිටිය, කලවාන.
voice - 0719227246